

මව්රට දැන් ඉරිදා
2026 ජුනි 28
හාට්
හදවත් හිරවෙත්තන් තැන...
HEAR
Shannan Deena
Click by Manula Kaushal

# බෝල්ට් ඇණේකට හිරවුණා

## තද වැඩි තරමට ප්‍රතිචාර වැඩියි...

## ස්පා එකක කෙල්ලෙක් මං...



**පියුමි ශ්‍රීනායක මේ දිනවල කාගේත් කතාබහට ලක්වෙලා. ඒ, 'බෝල්ට් ඇණේ' ටෙලිනාට්‍යයේ 'අමායා' හරහායි. ඒකාකාරී රාමුවලින් මිදී, ඕනෑම අභියෝගාත්මක චරිතයකට උපරිම සාධාරණය ඉටුකරන ඇය, ව්‍යාපාරික ලෝකය තුළද 'මිස් පියුමි' නමින් පෙරළියක් කරමින් සිටිනවා. මේ, ඇගේ ආදරය, ජීවිතය සහ කලාව ගැන 'හාට්' අපි කළ කතාබහයි.**

පියුමි ශ්‍රීනායක

**පියුමි මේ දිනවල බෝල්ට් ඇණේ හොඳටම තදයි වගේ?**

මේ දිනවල බෝල්ට් ඇණේට හිරවෙලා මමත්. තද වැඩි තරමට ප්‍රතිචාර ගලාගෙන එනවා. වෙනස්ම විදියේ ටෙලිනාට්‍යයක් විදියට බෝල්ට් ඇණේ ටෙලිනාට්‍යය මම දකින්නේ. ජෙනට් ඇන්තනීගේ රංගනය ඉතා තාත්විකයි. ගොඩ දෙනෙක් මේ නිර්මාණය රසවිඳින බව පේනවා. මේක බ්ලැක් කොමඩි කතාවක්.

**ඔබේ මේ චරිතය තුළ ලිමිට් තියෙනවද?**

ස්පාවලට යන ගැහැනු ළමයි තුන්දෙනෙක්ගෙන් එක්කෙනෙක් මම. මා සමග පියුමි, ශෙහානි අනෙක් චරිත දෙක නිරූපණය කරනවා. විවේචනයක් නෙවෙයි යන්නේ ඒ කතාව තුළ. ඔවුන්ගේ ජීවිතය තුළ විඳින දුක් කම්කටොලු, ගැහැනු ළමයි ඇයි මේ තත්ත්වයට පත්වෙන්නේ වගේ කතාවක් තමයි ගලාගෙන යන්නේ. මට ලිමිට් තියෙනවා. මොන වගේද කරන්න තියෙන්නේ කියලා මම බැලුවා. රංගන ශිල්පිනියක් වුණාම ඕනෑම චරිතයක් කරන්න පුළුවන් වෙන්න ඕනේ. රංගනයක් නිසා මම චරිතය ගැන ලොකුවට හිතන්නේ නැතුව උපරිම සහාය දෙනවා.

**චරිත ලැබෙනකම් පියුමි බලාගෙන ඉන්නවද?**

මම රඟපාන්නේ නැතුව කාලයක් ඉන්නවා. එකම විදියේ චරිත රඟපාන්න මම කැමැති නැහැ. හැබැයි එකම චරිතය රඟපෑවත් ඒ චරිතය තුළ වෙනසක් තියෙන්න ඕනේ. සමහර විට ප්‍රේක්ෂකයන් හිතනවා ඇති මම ක්ෂේත්‍රයෙන් ඈත්වෙලා ඇති කියලා. මට මේ දිනවල වෙනස්ම විදියේ චරිත දෙකක් ආවා. ඒ නිසා මම භාරගත්තා. 'තාල මණ්ඩිය' ටෙලිනාට්‍යයේ ප්‍රධාන චරිතය මම රඟපාන්නේ. විවිධ චරිත හරහා ප්‍රේක්ෂකයන් අතරට යන්න ඕනෙ නිසා තෝරා බේරාගෙන වැඩ කරනවා. අපේ දක්ෂතාව එළියට දාන්න විදියක් නැහැ. එහෙම වුණාම ඒකාකාරී වෙනවා. එහෙම වුණාම ප්‍රේක්ෂකයන්ට වගේම අපිටත් එපා වෙනවා.

> එකම විදියේ චරිත රඟපාන්න මම කැමැති නැහැ.

**අමායා වගේමද ඔබත් සාමාන්‍ය ජීවිතයේදී?**

අමායාට වඩා හාත්පසින්ම වෙනස්. හැබැයි අමායා කැමැති නැහැ එයා ගැන හොයලා බලනවට අමායාගේ පෙම්වතා. හැබැයි පෞද්ගලිකව මම කැමැති ඒ වගේ නිරන්තරයෙන් මම ගැන හොයලා බලනවට. අද කාලේ එහෙම හොයලා බලන්න ඕනෙ. මම දැන් ආදරවන්තියක්. ආදරය නැතුව ජීවත් වෙන්න බැහැ. පියුමි ශ්‍රීනායක වධකාර ආදරයට කැමැතියි. මට ඒ ආදරය ලැබෙනවා.

**කොහොමද ඔබගේ ව්‍යාපාර කටයුතු?**

'මිස් පියුමි' කියලා මගේම ආයුර්වේද හෙයාර් ඔයිල් බ්‍රෑන්ඩ් එකක් පටන් ගත්තා. ඒකට දැන් ලංකාවේ වගේම පිටරටවලින් පවා ඇණවුම් එනවා. ඉතින් ඒ වැඩකටයුතු වෙනුවෙන් උපරිම කාලය යොදවනවා රංගනයට අමතරව.

**ජීවිතය ගැන මොකද හිතෙන්නේ?**

මගේ ජීවිතයේ ලබපු කටුක අත්දැකීම් ගොඩයි. ඒ කටුක ජීවිතය සුන්දරත්වයක් වාසියක් වුණා. විවිධ ප්‍රශ්න ආවේ අපිව ශක්තිමත් කරන්න. ඉතින් මම ඒ දේවල් සතුටින් භාරගන්නවා. මම ගොඩක් සතුටින් ජීවිතය ගතකරන කෙනෙක්. අහිමි වුණු දේවල් ගැන පසුතැවෙන කෙනෙක් නෙවෙයි මම.



## මට ලිමිට් තියෙනවා...

වසන්ත විතාරණගේ

# සල්ලිකාර කෙල්ලො දපනේ දාන සල්ලාලයා...

**කඩවසම් පෙනුමකින් මෙන්ම දක්ෂතාවයෙන්ද පිරිපුන් ඔහු, මේ දිනවල 'ඔබ ඇවිත් යන්න එන්න' ටෙලිනාට්‍යයේ 'රමිත්'ගේ චරිතය හරහා සල්ලාල පෙම්වතෙකු ලෙස ප්‍රේක්ෂක හිත් හොරකම් කරමින් සිටිනවා. කෙටි කලකින් වේදිකාව, පුංචි තිරය වගේම සිනමාවත් එකවර ජයගන්නට වාසනාව උදා කරගත් ඔහු, ළඟදීම උදයකාන්ත වර්ණසූරියගේ 'මේඝ වර්ෂාවෙන්' රිදී තිරයටද පියනැගීමට සූදානම් වේ. නව පරපුරේ මේ ආකර්ෂණීය රංගන ශිල්පියා, ඕදාත හංසකයි. ඉතින්, 'හාට්' අපි අද අපේ කතාබහට ඔහුව මේ අයුරින් සම්බන්ධ කරගත්තා.**

**ඕදාත මේ දිනවල ගොඩක් සතුටින් වගේ?**

ඔව්. ගොඩක් සතුටින් කලා කටයුතු සහ මගේ වැඩකටයුතු සමග කාලය ගතකරනවා.

**මේ දිනවල කොහොමද ඕදාතගේ කලා කටයුතු?**

'ඔබ ඇවිත් යන්න එන්න' ටෙලිනාට්‍යයේ මම ප්‍රධාන චරිතයක් රඟපානවා. සල්ලිකාර කෙල්ලෙකුට ආදරය කරන සල්ලාල කොල්ලෙක්ගේ චරිතයක්. ගොඩක් සතුටුයි. පළමු වතාවට පෙම්වතාගේ චරිතයක් රඟපාමින් ප්‍රේක්ෂක ආදරය ලබමින් ඉන්නවා. රමිත් චරිතයට ලැබෙන ප්‍රතිචාර හොඳයි.

**පාසල් ප්‍රේමයත් මතක් වෙන්න ඇති චරිතය සමග හැඩහැගෙන කොට?**

අතීතය මතක් කරන අත්දැකීම් තියෙනවා. පාසල් කාලයේදී මම ආදරය කරලා තියෙනවා. ඒක ඉතින් වයසත් එක්ක එන බැඳීමක්. ඒ බැඳීම් ඉතින් කාලයත් එක්ක නැතිවෙලා යනවා. හැබැයි ඉතින් ටෙලිනාට්‍යයේ



## එක ඩාන්ස් එකෙන් වයිරල් වුණා...

## මල් වෙඩිල්ලක් වගේ පත්තු වුණා...

වගේ බයික්වල ගිහින් ආදරය කරපු පාසල් කාලයක් මට තිබුණේ නැහැ.

**මල් වෙඩිල්ලක් වගේ ඔබ එක පාරටම පත්තු වුණා?**

ඒකට හේතුව ඕෂාන් ලියනගේ යටතේ මම නර්තනය හැදෑරුවා. අපි අවුරුදු



# බයික්වල ගිහින් ලව් කරපු කාලයක් නම් තිබුණේ නැහැ...

ඊදාන ගංසක

මම මේ ක්ෂේත්‍රයට ඇවිත් ලොකු කාලයක් නැහැ.

උත්සවයේ ඩාන්ස් එකක් කළා. ඒක ගොඩක් වයිරල් වුණා. ඒ එක්කම 2024 හිරු කුමරා තරගාවලියේ මම දෙවැනි ස්ථානයට පත්වුණා. ඉතින් එකම කාලසීමාවක මේ දෙකෙන්ම ආපු ප්‍රතිචාරත් එක්ක මල් වෙඩිල්ලක් වගේ පත්තු වුණා.

**'මේඝ වර්ෂා' කවදා දිගහැරෙයිද?**

මේ අවුරුද්ද ඇතුළත බොහෝ දුරට මේඝ වර්ෂා ඇදහැලේවි. මම සම්බන්ධ වුණු පළමු සිනමා නිර්මාණය. එය උදයකාන්ත වර්ණසූරියගේ සිනමා නිර්මාණයක්.

**මේ දිනවල එන එන වැඩ භාරග න්නවා ඇති?**

ඔව්. මම මේ ක්ෂේත්‍රයට ඇවිත් ලොකු කාලයක් නැහැ. මට ඉගෙන ගන්න මේ ක්ෂේත්‍රය ගැන ගොඩක් දේවල් තියෙනවා. ඒ නිසා විවිධ චරිතවලට සම්බන්ධ වෙමින් ඉදිරියට යන්න බලාපොරොත්තු වෙනවා. අලුත් නිර්මාණ දෙකකට සම්බන්ධ වෙන්න ආරාධනා ලැබුණා. ඒ වැඩකටයුතු ළඟදී ආරම්භ වෙනවා.

**මේ වනවිට ඔබට හැම පැත්තකින්ම ඔබේ දක්ෂතාව පෙන්වන්න අවස්ථා ලැබිලා තියෙනවා?**

ඇත්තටම ඒ ගැන ගොඩක් සතුටුයි. ඉතා කෙටි කාලයක් තුළ වේදිකාව, ටෙලිනාට්‍ය, සිනමාව පැත්තෙන් මට මගේ දක්ෂතාව පෙන්වන්න අවස්ථාව ලැබුණා. ඒ, ඩී. කිරගලආරච්චිගේ 'ටුරුවිසි' වේදිකා නාට්‍යය හරහායි. 'ටුරුවිසි' මෙයට අවුරුදු තිහකට උඩදී වේදිකාගත කරපු නාට්‍යයක්. වේදිකා රංගනය මට වෙනස්ම අත්දැකීමක්.

වසන්ත විතාරණගේ

# මගේ ජීවිතය අම්මා...

ඇය පුංචි තිරයට ආදරණීය මවකි. ඇතැම් විට දුවලා සමග නිරන්තරයෙන් හැප්පෙන කලබලකාරී මවකි. 'ආලේ' මෙන්ම මේ දිනවල අතිශය ජනප්‍රිය 'බෝල්ටි ඇණේ' ටෙලිනාට්‍යය හරහා ප්‍රේක්ෂකයන් අතරට එන ඇය, රංගන ශිල්පිනී ශිරෝමිකා ප්‍රනාන්දුය. ඇගේ ජීවිතය මේ දිනවල ගෙවී යන්නේ දැඩි කැපවීමක් සහ සංවේදීතාවයක් මැදින්. ඒ, ඇගේ ආදරණීය මවගේ සුවදුක් බැලීම වෙනුවෙනි. රූගත කිරීම්වලින් කෙතරම් කාර්යබහුල වුවද, තම මව වෙනුවෙන් යුතුකම් ඉටුකිරීමට ඇය කිසිවිටකත් අමතක නොකරන්නීය. මව වෙනුවෙන් ජීවිතයම

## හැප්පෙන්නේ ඉතින් දුවලා එක්ක තමයි...

ශිරෝමිකා ප්‍රනාන්දු

**කොහොමද ඉතින් ශිරෝමිකා?**

හොඳින් ඉන්නවා. අම්මාවත් බලාගෙන කලා කටයුතු කරගෙන පවුලේ අය සමග සතුටින් ඉන්නවා.

**ඔබේ ආදරණීය අම්මා වෙනුවෙන් මේ දිනවල ලොකු කාලයක් වෙන්වෙනවා නේද?**

අම්මා මගේ ජීවිතය. ඇය වෙනුවෙන් මම උපරිම කාලය යොදවනවා. මේ බැඳීම සංසාරගත බැඳීමක්. ඒ තරමට ඇයට පණ වගේ ආදරෙයි. ඇය මගේ ජීවිතය ගොඩනගා ගන්න කරපු කැපකිරීම් නතර වුණා කියන්නේ මගේ අතපය කැඩුණා හා සමානයි. මම රූගත කිරීමකට ගියත් අම්මට අවශ්‍ය ආහාරපාන හදලා තියලා තමයි යන්නේ. අම්මා දියර ජාති පමණයි ආහාරයට ගන්නේ. මම රූගත කිරීම්වලට ගියත් හිත අම්මා ළඟ. ඇයට උපරිම සලකනවා. මට වගේම මගේ දරුවන්ටත් මගේ අම්මා අම්මා කෙනෙක් වුණා.

**මේ වගේ තත්ත්වයක ඔබ ඉද්දී කොහොමද මේ තරම් අපූරුවට චරිත මවන්නේ?**

මට මානසික සුවයකට පොඩ්ඩක් හරි තියෙන්නේ මේ කලා කටයුතු තමයි. ඒ වැඩකටයුතුවලදී චරිතයට මම උපරිම දායකත්වය ලබාදෙනවා. ජීවිතය පුරාවටම මම සතුටින් තමයි මේ ක්ෂේත්‍රයේ වැඩ කරන්නේ. දුකකට පත්වෙන්නේ අම්මා දැන් ඉන්න තත්ත්වය ගැන හිතලා තමයි.

**දකින හැමෝම බෝල්ටි ඇණයක් කියනවලු ශිරෝමිට?**

ඔව්. දකින හැමෝම අන්න බෝල්ටි ඇණයක් කියනවා. එහෙම තමයි කතා කරන්නේ. හිනාවක් දාමින් කතා කරනවා.

**මේ දිනවල ඔබේ චරිතවල කලබල ස්වභාවයක් දකිනවා?**

දුවලා එක්ක තමයි ටෙලි නිර්මාණවල හැප්පෙන්නේ. ගෙදරත් දුව එක්ක එහෙමයි. ඔවුන්ගේ අනාගතය වෙනුවෙන් තමයි කලබල ස්වභාවය. 'ආලේ' ටෙලිනාට්‍යයෙත් මවක්, 'බෝල්ටි ඇණෙත්' මවක්. ඉතින් දුවලා එක්කම තමයි කාලය ගතකරන්නේ. සාමාන්‍ය ජීවිතයේදී වුණත් අපි නිරන්තරයෙන්ම උත්සාහ කරන්නේ දරුවන්ගේ අනාගතය හදන්න. නිර්මාණවලත් එහෙමයි.



## හූටින් ගියත් හිත තියෙන්නේ අම්මා ළඟ...

උත්සාහ කරන්නේ දරුවන්ගේ අනාගතය හදන්න.



**ප්‍රේක්ෂකයන් නිරන්තරයෙන්ම කතාව ජෑම් නොකර රසවත් විදියට දෙන්න කියලා කියන්නේ. මෙහෙම වීමට හේතුව?**

නිර්මාණ මුලදී පටන්ගත්ත විදියට අවසානය දක්වා යනකොට කතාව නැරඹීමට පෙලඹීමක් එනවා. අපේ ශිල්පීන්ගේ පැවැත්ම අනුව තමයි කතාව ලස්සනට ගලාගෙන යන්නේ. නළු නිළියන්ගේ ප්‍රශ්න නැතුව. නවක අයගේ දින ප්‍රශ්න. කෝල් ආන්සර් කරන්නේ නැතුව ඉන්නකොට ප්‍රශ්න එනවා. එහෙම ප්‍රශ්න එනකොට රචකයාට කතාව ලස්සනට ලියන්න අපහසුයි. ඒ වගේ දේවල්වලට මුහුණ දෙන්න වෙනකොට තමයි කතාව ජෑම් වෙන්නේ.

**කොහොමද වේදිකා වැඩකටයුතු?**

මම ගොඩක් කැමැතියි වේදිකාවට. ඉල්ලන් කෑවා, සූකිරි බෝලේ, පැරීසියේ කිරිල්ලියෝ, එකට යටින් ඔය වේදිකා නාට්‍යවලට මම සම්බන්ධ වෙලා වැඩ කරගෙන යනවා.

හිතේ සතුට ටිකක් හරි දැනෙන්නෙ රංගනය නිසා...

වසන්ත විතාරණගේ

# මෙන්න ඇක්ටින් ඩාන්සින් දෙකම තියෙන ටැලන්ට් එකක්...

**රංගනය නොවුණා නම් ඩාන්සින් ටීචර් කෙනෙක් වෙන්න හිටපු, හැබැයි නාට්‍ය හා රංගකලාව ඉගෙනගෙ නම ක්ෂේත්‍රයට ආපු අමුතුම කෙල්ලෙක්... ප්‍රවීණයෝ එක්ක වැඩ කරද්දී වැරදි හදාගෙන, 'අපි තෝරගන්න මිනිස්සු අනුව තමයි ආදරේ සුන්දර වෙන්නේ' කියන තියරියක ඉන්න, ආධුනික වුණත් ලොකු ගමනක් යන්න ඉන්න චතුනි රාජපක්ෂ ගැනයි අද 'හාට්' අපේ කතාව.**



**ඉතින් චතුනි මේ දවස් වල මොකද වෙන්නේ?**

මේ දිනවල රංගන ක්ෂේත්‍රයේ වැඩකටයුතු හා අනෙකුත් වැඩකටයුතු කරමින් සතුටින් ඉන්නවා.

**ඔබ කොහොමද රංගනයට පිවිසෙන්නේ?**

මුලින්ම රංගනයට පිවිසෙන්නේ 2025දී පැවැත්වූ ඔඩිෂන් එකක් හරහයි. ඒ ස්වර්ණවාහිනියේ විකාශය වූ 'කුරුල්ලෝ' ටෙලිනාට්‍යයේ නයෝමිගේ චරිතයෙන්.

**ඔබ මේ ක්ෂේත්‍රයේ රැඳී ඉන්න යම් හැදෑරීමක් සිදුකරනවද?**

අනිවාරෙන්ම. රංගන ක්ෂේත්‍රයේ රැඳි ඉන්න නම් එහි වැඩිදුර අධ්‍යාපනයක් ලැබිය යුතුයි. දැනට මම උසස්පෙළ සඳහා නාට්‍ය හා රංගකලාව හදාරා ලැබූ දැනුමින් මේ තැන ඉන්නේ. නමුත් එය මදි. මම මේ ක්ෂේත්‍රයේ රැඳී සිටිමට ඒ සඳහා අවශ්‍ය දැනුම ලබාග ැනීමට ඉදිරියේදි පාඨමාලා කිහිපයකට සම්බන්ධ වීමට බලාපොරොත්තුවෙන් ඉන්නෙ.

**ඔබ නිර්මාණ භාර ගැනීමේදී තෝරාබේරා ගැනීමක් සිදුකරනවාද?**

ඔව්, නිර්මාණයක් භාරග ැනීමේදි මම බලන කරුණු කිහිපයක් තියෙනවා. මුලින්ම බලන්නෙ ඒ චරිතේ මට ගැළපෙනවද යන්න. ඊට අමතරව මට ඒ චරිතයට සාධාරණයක් කරන්න පුළුවන්ද කියලත් බලනවා. ඒ දේවල් බලලා තමා මට ලැබෙන චරිතය සඳහා දායක වෙනවාද නැද්ද යන්න තීරණය කරන්නෙ.

**ඔබට මේ නිර්මාණය තුළින් ලැබෙන ප්‍රේක්ෂක ආදරය කොයි වගේද?**

ප්‍රේක්ෂකයන්ගේ හොඳ ප්‍රතිචාර වගේම ආදරයත් නොඅඩුව ලැබෙනවා. නමුත් ජනතාව අතරේ ජනප්‍රිය චරිතයක් වෙන්න නම්, තවම ආධුනික රංගන ශිල්පිනියක් හැටියට තව ටික කාලයක් යයි.

**ඔබ රංගන කටයුතු සිදු නොකළා නම් අද චතුනි කියන්නේ කවුද?**

මං රංගන කටයුතු නොකළා නම් අද මම නර්තනය පැත්තෙන් ඉදිරියට ගිහින් නර්තන ගුරුවරියක් ලෙස කටයුතු කරන්න තිබුණා. නමුත් මගේ කුඩා කල සිටම කැමැත්ත තිබුණේ රංගනයෙන් හා නර්තනයෙන් යන දෙකෙන්ම ඉදිරියට යාමටයි. ලැබෙන අවස්ථාවල හැටියට ක්ෂේත්‍ර දෙකේම කටයුතු කරගෙන යන්න බලාපොරොත්තුවෙන් ඉන්නවා

**මේ ක්ෂේත්‍රයේ ප්‍රවීණයන් සමග වැඩ කිරීමේදී ලැබෙන අත්දැකීම ටිකක් විස්තර කරමුද?**

ක්ෂේත්‍රයේ ප්‍රවීණයෝ සමග වැඩ කරන්න ලැබෙන එක ගොඩක් වටිනවා වගේම සතුටුයි. ඔවුන්ගෙන් ඉගෙන ගන්න දේවල් ගොඩක් තියෙනවා. ඒ වගේම තමා ඔවුන් අපිට අපේ වැරදි අඩුපාඩු කියලා දෙනව වගේම අපිට ඔවුන්ගේන් ලොකු සහයෝගයක් ලැබෙනවා.

**'ඇත්තමයි මං ඔයාට ආදරෙයි' ටෙලිනාට්‍යට සම්බන්ධ වෙන්නේ කොහොමද?**

ඒ අවස්ථාව ලැබුණේ හිරු ටීවී නාලිකාව හරහා පවත්වපු ඔඩිෂන් එකක් හරහා. ඒකෙන් පස්සේ මට උපේක්ෂාගේ චරිතයේ තරුණ කාලය රඟ දැක්වීමට අවස්ථාව ලැබුණා. ඊට අමතරව නාට්‍ය ගැන චුට්ටක් කියන්න ඕනේ. ධනුෂ්ක රත්නායක අයියා අධ්‍යක්ෂණය කරන දැවැන්ත නිර්මාණයක්. මේ අවස්ථාව මට ලැබුණු එක ගැන මම ගොඩක් සතුටු වෙනවා.

**කලා ගමනට ගෙදරින් ලැබෙන සහයෝගය කොහොමද?**

කලා ගමනෙන් ඉදිරියට යන්න ගෙදරින් ලොකු සහයෝග යක් මට ලැබෙනවා. ඉතින් ඒක ගැන නිහතමානී සතුටක් තියෙනවා

**ඔබ ආදරය දකින්නේ කොහොමද?**

ආදරය කියන්නෙ හරි සුන්දර දෙයක්. ආදරය හැම කෙනෙක්ටම ඕනෙ දෙයක්. ආදරය මිහිරි එකක්ද, අමිහිරි එකක්ද වෙන්නෙ අපි තෝරාග න්න මිනිස්සු අනුව.

**දිගටම රංගන ක්ෂේත්‍රයේ රැඳී පවතින්න ඔබ මොනවද කරන්නේ?**

හොඳ නිර්මාණවලට සම්බන්ධ වෙලා ප්‍රේක්ෂක ආදරය ලබාගෙන ඉදිරියට යන්න බලාපොරොත්තු වෙනවා.

**ඔබගේ ඉදිරි වැඩකටයුතු ගැන මතක් කළොත්?**

දැනට නම් ඇත්තමයි මං ඔයාට ආදරෙයි නාට්‍යයේ වැඩකටයුතු කරගෙන ඉන්නවා. ඊට අමතරව හොඳ පිළිගත් නිර්මාණවලින් ඉදිරියට එන්න බලාපොරොත්තු වෙනවා ඒ වගේම තව වැඩ කිහිපයක් කරන්න සැලසුම් කරලා තියෙනවා. ඒවා ඉදිරියේදී ඔබට දැකගන්න ලැබෙයි.

**කල්ප මේනක පීරිස්**

**ලැබෙන හැම එකම කරන්නේ නැහැ...**




# කරන්න පුළුවන්ද කියලා බලලයි ගන්නේ...

**පසුගිය දවස්වල මුහුණු පොතේ 'කළු කුමාරයා' ගැන මොකක්දෝ මන්දා පෝස්ටුවක් ජයටම වයිරල් වෙනවා. 'කළු කුමාරයා' කිව්වට මේ පෝස්ටුව අර ඒ කාලේ තරුණ ළමිස්සියන්ව බියට පත්කරපු 'කළු කුමාරයා' ගැන කතන්දරයක් නෙවෙයි. මේ කියන 'කළු කුමාරයා' ටිකක් අලුත් තාලේ එකෙක්. අනෙක ඒක මියුසික් වීඩියෝවක්. 'මනමාල කතා' නමින් එළිදැක්වුණු මේ මියුසික් වීඩියෝවේ කළු කුමාරයාගේ චරිතයට පණ දෙන ගමන් ගීතය ගයන්නේ ජනප්‍රිය සිනමා සහ ටෙලි නළු සජිත අනුත්තර. සහාය ගායනයක් එක්කම සජිත එක්ක රංගනයට හවුල් වෙන්නේ සිය මනමෝහනීය ගායනයේ තරුණ සිත් උන්මාදනීය කළ ජනප්‍රිය ගායිකා කාංචනා අනුරාධි.**



**'කොහොමද ඒක මරු නේ...?'**

'මනමාල කතා' බලපු දසදහස් ගණනක් ප්‍රේක්ෂකයෙ එයට ප්‍රතිචාරය දුන්නේ අන්න එහෙමයි. ඒ විතරක්ම නෙවෙයි. මේ 'මනමාල කතා' ගැන මේ පෝස්ටුව හිට් වෙන්න තවත් හේතුවක් වුණේ කාංචනා අනුරාධිගේ රංගන ශෛලිය සහ සජිත ඈ ගැන දුන්න අලුත් තාලේ නිවුස් එක. නිවුස් එකේ සටහන් වුණේ සජිත කළු කුමාරයාගේ මනමාල චරිතය සිනමාවට අරන් එන්න ස්ක්‍රිප්ට් එක ලියන කාරණය සහ කාංචනාව ෆිල්ම් එකේ මෙන් රෝල් එකට ගන්න කාරණයයි.

මේ නිවුස් එක ඇත්තක්ද? නැත්නම් ගොසිප් එළකක්ද කියන කතන්දරේ අහන්නයි 'මනමාල කතා' ගැන ඩිංගක් කතා කරන්නයි අපි ගියා 'හාට්' එකට සජිතව හවුල් කරගන්න.

**ඉතින් සජිත දහසකුත් එකක් වැඩ අතර ඔන්න අපි ආවා 'මනමාල කතා' ගැන තා කරන්න?**

බොහොමත්ම සතුටින් පිළිග න්නවා. කිව්වා වාගෙම දහසකුත් එක්ක වැඩ අතර තමයි පහුගිය දවස්වල හිටියේ.

**මුලින්ම කියමුකො ඔය හැටි තිබුණු වැඩ රාශිය ගැන?**

'පාට කුරුල්ලෝ' ෂූටින් තිබුණා. ඒ අතර චිත්‍රපට කිහිපයකම වැඩ ඉවර කළා. තව අලුත්ම චිත්‍රපට කිහිපයකම වැඩ පටන් ගත්තා. එහි රූගත කිරීම් සිද්ධ වෙනවා. ඒ අතර තවත් අලුත් චිත්‍රපට කිහිපයකම ගිවිසුම් අස්සන් කරන සූදානමක ඉන්නවා.

**කිව්වත් වාගෙම මහ වැඩ ගොඩක්. ඒ හැම එකම පැත්තකින් තියලා අපි 'මනමාල කතා' ගැන කතා කරමු?**

ඔව්. ඒක කතාකරන්න වටිනම වැඩක්. කාගෙත් හිත දැපනෙ වැටුණු ලස්සන වැඩක්.

**මියුසික් වීඩියෝව එකසිය ගානට වයිරල් වෙනවා සජිත?**

දැනගෙන හිටියා ඒක. මොකද මනමාල කතාවලට සම්මාදම් වෙච්ච පිරිස සහ එය නිර්මාණය වෙච්ච ආකාරයත් කන්සෙප්ට් එකට කළු කුමාරයා මැදිහත් වෙච්ච කාරණයත් නිසා මේක එකසිය ගානට හිට් වෙන බව අපි දැනගෙන හිටියා.

කාංචනා අනුරාධි අලුතින්ම ගායනයෙන් එක්වන මේ ගීතයට සංගීතය දුන්නේ ප්‍රවීණ සංගීතඥ රෝහණ වීරසිංහ. මියුසික් වීඩියෝව ප්‍රඩියුස් කළේ අමිත් ගුරු අයියා. චමිල් පතිරණගේ අධ්‍යක්ෂණය. මේ හැම දේම සමග තමයි 'මනමාල කතා' අලංකාර වුණේ. ඒක මගේ විතරක් තනි මෙහෙවරක් නෙවෙයි කියන කාරණය විශේෂයෙන කිව යුතුමයි.

**වැඩිපුර කතා වෙන්නේ ඔබ ගැනයි සජිත. හරි අපූරුවට ඔබ කළු කුමාරයට රඟනවලු?**

සතුටුයි ඒ ප්‍රතිචාරය ගැන. ඒ වගේම අගය කරන හැම දෙනාටම ස්තුති කරනවා.

**කළු කුමාර චරිතය සමග ඔබට මොකක්දෝ මන්දා ජානමය සහ ගුප්ත සබඳතාවක් තියෙනව වගේ?**

ඔව්නේ. කොහේ හෝ කොතැනක හෝ කළු කුමාරයා ගැන චරිතයක් නිර්මාණය වෙනවද, ඒ බොහොමයක් නිර්මාණකරුවන්ගේ ඔළුවට එන්නේ සජිත අනුත්තර සමග ඔහුගේ පෙනුම.

**ඒ රහස සහ සංසිද්ධියෙහි සම්බන්ධතාව මොකක් වෙන්න පුළුවන්ද?**

මගේ කාළ වර්ණ පෙනුම නිසා කළු කුමාර චරිතයට මාව ගන්න හැමෝටම හිතෙනවා වෙන්න පුළුවන්.


**ඒ උත්තරය නම් ලිස්සා යෑමක් සජිත. ටිකක් කළු පාට නළුවො තව කොයි තරම් ඉන්නවද?**

ඒකත් ඇත්ත. හිතාගන්න

# එකසිය ගානට වයිරල් වෙන කළු කුමාරයාගේ මනමාල කතාව...







**කාංචනා කැමති වෙයිද දන්නේ නැහැ...**

**අප්පච්චි වගේ වෙන්න ගොඩක් දුර යන්න තියෙනවා...**

**කළු කුමාරයා කිව්වම හැමෝටම මැවෙන්න මාව...**

බැහැ ඇත්තටම ඒ කාරණයට හේතුව මොකක්ද කියලා. ඒ ඇයිද කියනවා නම් විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලබන කාලේ හර්ෂිකා රත්නායකගේ මෙහෙයවීම තුළ අපි කළු කුමාරයාගේ චරිතය මූලික කරගෙන ගීත නාටකයක් කළා. 'නීල මදන පුවත' කියලා. එදත් කළු කුමාරයාගේ චරිතය කෙළින්ම ලැබුණේ මටයි. ඉන් පස්සේ කාලයක් ගිය තැන මට මගේම කියලා මියුසික් වීඩියෝවක් නිර්මාණය කරන්න හිතුණු තැනදී මගේ ඔළුවට නිරායාසයෙන්ම ආවේ කළු කුමාර චරිතය. 'කළුවර' නමින් ඒ මියුසික් වීඩියෝව මම කළා.

**එතකොට ඔබේ අප්පච්චි, 'ඝරසරප' චිත්‍රපටයේ ඔහු රඟපෑවෙත් කළු කුමාරයට?**

මම මේ මතක් කරන්න හැදුවා විතරයි. ඔබ කිව්වා වගේම තව බොහොමයක් අය කියනවා කළු කුමාරයා සමග මොකක් හෝ ලේ නෑදෑකමක් අපට තියෙනවා කියලා. සමහර විට එය දෛවෝපගත සංසිද්ධියක් වෙන්න ඇති.

**අපි වෙනත් කතාවකට යමු. කළු කුමාරයාගේ 'මනමාල කතා' හරහා ඔබ සිනමා පටයක් කරන්න යන බව ආරංචියි?**

ඔව්. සිනමා පටයක් සඳහා තිර පිටපතක් ලියමින් ඉන්නවා. එය මගේ පළමු සිනමා තිර රචනය සහ අධ්‍යක්ෂණය වෙන්න ඉඩ තියේවි බොහෝ විට.

**ඔබ දෙගිඩියාවෙන් වගේ කතා කරන ස්වරූපයක් තියෙන්නේ?**

හැම මොහොතකම අපි හිතන්න ඕනෙ කාරණයක් තියෙනවා. ඒ තමයි ඊළඟ මොහොත අවිනිශ්චිතයි කියන එක. අපි හිතන පතන දේ හෙට වෙනස් වෙන්න පුළුවන්. මෙතැනදී වුණත් කළු කුමාරයාගේ චරිතය ගැන ලියන තිර පිටපත වෙනස් වෙලා වෙනත් තිර පිටපතක් හරහා මම වෙනත් සිනමා නිර්මාණයක් පළමුව කරන්නට පුළුවන්. ඒ නිසයි දෙගිඩියාවෙන් වගේ කතා කළේ.

**කළු කුමාරයාගේ තිරපිටපත ඔබ ලියන්නේ සහාය නිළියට කාංචනා අනුරාධිව ඔළුවේ තියාගෙනද?**

ඔව්. එහෙම අදහසක් තියෙනවා. ඈ 'මනමාල කතා' මියුසික් වීඩියෝවේ රංගනය බොහොම අලංකාරව කළ නිසා මට හිතුණා මගේ සිනමා නිර්මාණයට ඇයව දායක කරගන්න. ගායනය වගේම ඇගේ රංගන කෞශල්‍යයත් ඉතා මනහර බව කියමින් බොහොමයක් දෙනා ප්‍රතිචාර දක්වා තිබුණා.

**ඔබ ඒ පිළිබඳ ඇය සමග කතාබහ කර අවසානයිද?**

අපොයි නැහැ. තවම ඒ තරමට දුර ගියේ නැහැ. යන්න හිතුවෙත් නැහැ. ඇය එයට මනාව වෙයිද කියලා මම දන්නෙත් නැහැ. බලමු අපි ඉස්සරහට.

**කාංචනා අනුරාධි එයට මනාප නොවුණොත් ඒ සඳහා වෙනත් නිළියක් ඔබ අනුමාන කරගෙන ඉන්නවද?**

නැහැ. තවම ඒ ගැන අදහසක් නැහැ.

**කළු කුමාර චරිතය අදලලා තැනෙන ඔබේ සිනමා නිර්මාණයෙහි ස්වභාවය ගැන යමක් කියනවා නම්?**

කළු කුමාරයා ගැන ඒ කාලෙට අනුව නම් කිව්වේ පෙරේත බැල්මක් හා අවතාර පෙනුමක් කියන ගුප්ත චරිතයක් ගැනයි. තාක්ෂණය හා විද්‍යාව සමගින් දවසින් දවස ඉදිරියට යන මේ නවතම යුගය සමග මගේ සිනමා නිර්මාණයට පාදක කරගන්නා කළු කුමාර චරිතය නව සංකල්පයකට අනුව සමාජය හමුවට ගෙන එන්නයි මම අදහස් කරගෙන ඉන්නේ. ඒ කියන්නේ මොඩ්ෆයි කළු කුමාර චරිතයක් ගෙන එනනයි සූදානම. එහෙම හිතමු. දැනට මං හිතන්නේ ඒ ගැන කතාව ඇති. සිනමා නිර්මාණය ආව දවසට අලුත් කළු කුමාරයා ගැන අපි කතා කරමු.

**හොඳයි. අපි මෙහෙම අහමු. සිනමා නිර්මාණයක් අධ්‍යක්ෂණය කිරීමේ සිහිනයක් ඔබට තිබුණා?**

අනිවාර්යයෙන්ම සිනමා නිර්මාණයක් අධ්‍යක්ෂණය කරන තුරුම මම ඒ හීනය දකිනවා. එය නව අදහස් සමග තව තව දලුලා වැඩෙනවා.

**ඔබේ අප්පච්චි සිනමා නිර්මාණ හරහා ප්‍රවීණයකු වීම නිසාද ඔබ ඒ හීනයට පිවිසුණේ?**

ඔව්. අප්පච්චිගේ සිනමා නිර්මාණ තුළින් මා ලබාගත් අභාසය විශාලයි. ඒ හරහා මම මියුසික් වීඩියෝ නිර්මාණයට යොමු වුණෙත් ඒ හීනයට ඇති ළැදියාව නිසයි. කෙමෙන් කෙමෙන් චිත්‍රපට අධ්‍යක්ෂවරයකු ලෙස සිනමා නිර්මාණයට යොමුවීම සඳහා මියුසික් වීඩියෝ නිර්මාණයට විශාල පෙරහුරුවක් වුණා.

**සකල කලා සක්විති ජැක්සන් ඇන්තනී වෙනුවෙන් සොබාදහම තිළිණ දුන් විකල්පය ඔබ බවයි බොහෝ දෙනා කියන්නේ?**

එවැනි මහා පෞරුෂයක් තියෙන ප්‍රවීණ කලාකරුවකුට මා සම කිරීම මට මහත් ගෞරවයක්. නමුත් මගේ අප්පච්චි වගේ වෙන්නට නම් මා තව බොහෝ දුර යායුතු බවයි මගේ හැඟීම.

**බොහෝ දෙනා ඔබේ රංගන ප්‍රතිභාව සහ ස්වභාවය අප්පච්චිට සමාන බව කියනවා?**

අප්පච්චි සතුව තිබූ මහා දැනුම් සම්භාරය සහ ශිල්පීය දැනුම මටත් මගේ අයියා අබිලට සහ අක්කා මාධවීටත් සම සමව බෙදී ගිහින් තියෙනවා. අප්පච්චිගේ පෙනුම සහ ස්වභාවය වැඩිපුරම තියෙන්නේ අයියටයි. මගේ සිතුවිල්ල එයයි.

**අප්පච්චිගේ රංගන කෞශල්‍යයෙහි හොඳම සාරය ඔබට වැඩි වශයෙන් දායාද කොට ඇති බවයි කවුරුත් කියන්නේ?**

මටත් එහෙම ඇහිලා තියෙනවා. ඒත් මම හිතන්නේ අප්පච්චිගේ මහා පෞරුෂය අපි තුන්දෙනාට සම සමව ලැබුණා. මට තියෙන සමහර හැකියාවන් අයියට නැහැ කියලා කවුරු හරි කියනවා නම් අයියට තියෙන සමහර හැකියාවන් මටත් නැහැ. අක්කට තියෙන්නේ වෙනස්ම අපූර්වතම ස්වභාවයක්. අන්න ඒ සිතුවිල්ල තුළයි මම ඉන්නේ.

**සිනමා, ටෙලි සහ සංගීත කලාව තුළ මෙතෙක් ඔබ පැමිණ ඇති ගමන ගැන ඔබ සෑහීමකට පත්වෙනවද?**

ඔව්. ආ මග හැරී බලන කල මට මා ගැන සතුටුයි. අනෙක මම කලාකාමී මවුපිය යුවලකට උපන් පුතෙකු වීම ගැනද සුවිශේෂව සතුටු වෙනවා. කෙටියෙන් සරලව කියනවා නම් මම වාසනාවන්තයි.

**මල්මි කෞශල්‍යා**

# ලෙන්ස් අස්සේ රජකම් කරන තරහ මරහ නැති

# වැඩේ මාර ආතල් කරගත් ඩිරෙක්ටර්...





ෆැෂන්වලට මාර ආසාවක් තිබ්බා...

මම හැමෝම එක්ක සුහදව වැඩ කරන කෙනෙක්.

**ශ්‍රී ලාංකේය ටෙලිනාට්‍ය හා සිනමා ක්ෂේත්‍රයේ කැමරා අධ්‍යක්ෂවරයෙකු ලෙස වසර ගණනාවක් පුරා සිය දායකත්වය ලබාදී ඇති ප්‍රවීණ කැමරා අධ්‍යක්ෂ තුසිත අනුරාධ, කැමරාව පිටුපස සිටිමින් චරිත හා කතා ප්‍රේක්ෂක හදවත් වෙත සමීප කළ නිර්මාණකරුවෙකි. සිය වෘත්තීය දක්ෂතාව සහ කැපවීම හරහා ක්ෂේත්‍රයේ ආදරය හා ගෞරවය දිනාගත් ඔහු, සිය වෘත්තීය ගමනේ අත්දැකීම්, අමතක නොවන මතකයන් සහ ඉදිරි නිර්මාණ කටයුතු පිළිබඳ 'හාට්' සමග අදහස් දැක්වූයේ මෙසේය.**

තුසිත අනුරාධ

ටෙලිනාට්‍ය 20කට අධික ප්‍රමාණයකට දායක වී තිබෙනවා.

**තුසිතගේ ළමා කාලය ගෙවුණු පරිසරය, උපන් ගම සහ අධ්‍යාපන හැදෑරුවේ කොහේද යන්න මුලින්ම කතා කරමු?**

මම ඉපදුණේ මැද කොළඹ. දැන් මගේ පදිංචිය හංවැල්ලේ. ශ්‍රීමත් බාරෝන් ජයතිලක විද්‍යාලයේ තමයි අධ්‍යාපනය හැදෑරුවේ.

**කැමරා අධ්‍යක්ෂණය දක්වා ආ ගමන ගැන මතක් කළොත්?**

2000 වසරේදී පමණ තමයි මගේ කලා ගමන ආරම්භ වුණේ. මුලින්ම මම සම්බන්ධ වුණේ ටී.වී.ටී. ආයතනයේ තාක්ෂණික අංශයටයි. එහි ආලෝකකරණ කටයුතු කිරීමෙන් තමයි මගේ වෘත්තීය ජීවිතයේ පළමු පියවර තැබුණේ. ඒ විදිහට ලැබුණු දැනුම, කැපවීම සහ අත්දැකීම් එක්ක අද වනවිට කැමරා අධ්‍යක්ෂවරයකු ලෙස කටයුතු කිරීමට හැකිවී තිබෙනවා.

**මේ දිනවල කාර්යබහුල වෙලා ඉන්නේ මොන නිර්මාණ එක්කද?**

ස්වර්ණවාහිනියේ ජහුටා, දෙරණ නාලිකාවේ කොළඹ කට්ටිය එක්ක තමයි මේ දවස්වල වැඩ කටයුතු කරගෙන ඉන්නේ.

**සද්ධාමංගල සහ ශිවගුරුනාදන් දෙදෙනාගේ නිර්මාණයන්වල පමණක්ද ඔබ වැඩ කරන්නේ?**

ෆීල්ඩ් එකට ආවට පස්සේ වැඩි ප්‍රමාණයක් ශිවා අයියා සහ සද්ධා අයියාගේ ටෙලිනාට්‍ය නිර්මාණයන්ට තමයි සම්බන්ධ වුණේ.

**දැනට ඔබ දායක වී ඇති ටෙලිනාට්‍ය සහ චිත්‍රපට ප්‍රමාණය ගැන සඳහන් කළොත්?**

මේ වනවිට මම ටෙලිනාට්‍ය 20කට අධික ප්‍රමාණයකට දායක වී තිබෙනවා. ඒ වගේම චිත්‍රපට පහකට පමණ කැමරා අධ්‍යක්ෂණයෙන් දායක වීමට අවස්ථාව ලැබුණා. මේ සියලු නිර්මාණ හරහා විවිධ අත්දැකීම් ලබාගෙන, වෘත්තීය වශයෙන් මගේ ගමන තවදුරටත් ශක්තිමත් කරගැනීමට හැකි වුණා.

**ඔබ දැන් සිටින තැන ගැන ඔබ තෘප්තිමත්ද?**

ඔව්. සෑහෙන්න සතුටුයි.

**සාර්ථකත්වය පිටුපස සෙවණැලි ඔබටත් තියෙන්න ඇති?**

ශිවා අයියා තමයි මගේ ලොකුම හෙවණැල්ල. එයා මට ලොකු සපෝර්ට් එකක් මේ ගමනට දුන්නා. ශිවා අයියාට මං ගැන තියෙන විශ්වාසය සහ ඒ වැඩේ මම වගකීමෙන් කරන නිසා තමයි මට වැඩ බාර දෙන්නේ. ඉතින් ඒ විශ්වාසය මම උපරිමයෙන් රකිනවා.

**රූගත කිරීම්වලදී අමතක නොවන මතකයන් ඇති?**

'පහ සමත්' චිත්‍රපටයේ රූගත කිරීම් තිබුණා දැරණියගල. ඒ ලොකේෂන් එකට වාහනවලින් යන්න බැහැ. ඇවිදගෙන තමයි යන්න තිබුණේ. මමයි ශිවා අයියයි උද්දික ප්‍රේමරත්නයි කැලෙන් ඇවිදගෙන ගිහින් කොන්ක්‍රීට් පාලමකින් ලොකේෂන් එකට එගොඩ වෙන්න තිබුණේ. මම තමයි ඉස්සර වෙලා ගියේ. ශිවා අයියයි උද්දිකයි මට පිටුපසින් ආවේ. මම ඉස්සරහට ඇවිදගෙන යන අතරමග පාලමෙන් ජරස් බරස් ගාලා ශබ්දයක් ඇහුණා. මම එගොඩ වෙලා ආපහු හැරිලා බලද්දී ශිවා අයියයි උද්දිකයි පේන්න හිටියේ නැහැ. පස්සේ දැක්කේ පාලම දෙකට මැද්දෙන් කඩාගෙන පහළට වැටිලා. උද්දික ඉන්නවා ශිවා අයියව බදාගෙන. මට හිනා ගියා, ලොකු බයකුත් ඇති වුණා අනතුරක් වුණා නම් කියලා. අදටත් ඒ සිදුවීම ගැන හිතාගන්න අමාරුයි.

මගේ හෙවණැල්ල ශිවා අයියා...

**තුසිත ෆැෂන්වලට බර කෙනෙක් නේද?**

ෆැෂන්වලට ඉස්සර ඉඳලම තිබුණා මගේ ආසාවක්. මිනිස්සු එක්ක ගනුදෙනු කරද්දී අපි ලස්සනට ප්‍රියමනාපව ඉන්න ඕනි කියන මතේ මගේ තියෙනවා.

**රඟපාන්න ආරාධනා ලැබිලා නැද්ද?**

ධනුෂ්ක රත්නායක අධ්‍යක්ෂණය කරපු 'බයෝ' නාට්‍යයට ඔහු ආරාධනා කරලා මම බන්ධනාගාර සිරකරුවකුගේ චරිතයක් කළා.

**ක්ෂේත්‍රයේ රංගන ශිල්පීන්ගෙන් තුසිතට ලොකු ආදරයක් ලැබෙනවා නේද?**

මම හැමෝම එක්ක සුහදව වැඩ කරන කෙනෙක්. ඒක මගේ වචනෙන් කිව්වොත් මාර ආතල්. යම් අවස්ථා තියෙනවා තර්කවලට යන. නමුත් ඒක වැඩේදි විතරයි. පෞද්ගලික අමනාපකම් තියා ගන්නේ නැහැ.

**පවුලේ විස්තර?**

මම විවාහකයි. මගේ බිරිඳ නිලූකා. මට ළමයි දෙන්නෙක් ඉන්නවා. පුතා යස්මින සහ දුව මෙනුරි.

**ගෙදරින් ලැබෙන සහයෝගය?**

වචනවලින් කියලා නිම කරන්න බැරි ලොකු සහයෝගයක් මට ලැබෙනවා. මං ගැන විශ්වාසය තියලා මගෙ බිරිඳ මගේ කලා කටයුතුවලට ලොකු සහයෝගයක් දෙන්නේ. ඉතින් ඒ විශ්වාසය මට ලොකු සහායක්.

**ඉදිරි නිර්මාණ?**

ප්‍රියන්ත ශ්‍රී කියලා කෙනෙක්ගේ ටෙලි නිර්මාණයක් එන්න තියෙනවා. ඒක ෂූටින් කරලා අවසන් කළා පහුගිය දවස්වල. මේ දවස්වල ඒක එඩිට් එකේ තියෙන්නේ.

**ස්ටෙෆනි කොතලාවල**






# ලග්න පහකට විශේෂ ලැබීම්

# අධ්‍යාපන අංශය ගැන කසුකුසුවකුත්

# ලෝක ජනතාවට සතුටට හේතු

# කාන්තාවන් ගැනත් කතාබස්

## 2026.06.28 සිට 2026.07.04 දක්වා

## කුජ, යුරේනස්, රවි, ගුරු, බුධ, සිකුරු, ශනි, නැප්චූන් යෝග පොකුරක් සහිත සතියක්.

## චන්ද්‍රයාගෙන් තීරණාත්මක රාශි මාරුකිරීම් තුනක්



**2026.06.28 වැනිදායින් ආරම්භ වන ඉදිරි සතියේ සමස්ත ග්‍රහ ගෝචරයන් සැලකිල්ලට ගැනීමේදී සතියේ ආරම්භයේම කුජ යුරේනස් වෘෂභ රාශියේත්, රවි, ගුරු, මිථුන රාශියේත්, බුධ, සිකුරු කටක රාශියේත්, කේතු ග්‍රහයා සිංහල රාශියේත්, චන්ද්‍රයා වෘශ්චික රාශියේත්, රාහු කුම්භ රාශියේත්, සෙනසුරු සහ නැප්චූන් මීන රාශියේත් ගෝචරව සිටිති. ඒ අනුව සමස්ත ග්‍රහ සිත්තම තුළ රවි, ගුරු යෝගයක්, බුධ සිකුරු යෝගයක්, කුජ යුරේනස් යෝග යක්, ශනි නැප්චූන් යෝග යක්ද පෙන්නුම් කරයි. එමෙන්ම මෙම 28 වැනිදා සිට ජූලි 04 වැනිදා දක්වා සඳු හෙවත් චන්ද්‍රයා සිය ගෝචර ගමනේදී වෘශ්චික, ධනු, මකර යන රාශි ත්‍රිත්වයේම ගෝචර වීමට නියමිතය.**

මෙම ග්‍රහ තත්ත්වය අනුව විමසීමේදී ඉදිරි සතිය ඉතා තීරණාත්මක සතියක් බව පෙන්නුම් කෙරේ. ඒ අනුව ඉදිරි සතියේ ලෝකවාසී ජනතාවට සැනසිලිදායක පුවතක් අසන්නට ලැබෙනු ඇත. එමෙන්ම ජනතාවගේ යහපත උදෙසා ගැනෙන විශේෂ තීන්දු තීරණ කිහිපයක් ලෝකයේ විවිධ තැන්වලින් ඇසෙන්නට ඉඩ තිබේ. ලෝකය තුළ හෝ රට තුළ ස්ත්‍රීන් සම්බන්ධ කතාබහක් මෙන්ම අධ්‍යාපනය සම්බන්ධ කතාබස් දුරදිග යන බවක් පෙන්නුම් කෙරේ. එමෙන්ම රට තුළ ආහාර හෝ ඒ ආශ්‍රිත මාතෘකා සම්බන්ධ යම් යම් කතාබස් ඇතිවීමට ඉඩ තිබේ.

සතිය අවසානයේ යම් ආන්දෝලනාත්මක පුවතක් අසන්නට ලැබෙනු ඇත. එමෙන්ම අතපසුවීමක්, මගහැරීමක් හෝ ඊට සමාන කාරණාවක් කතාබහට ගන්නට සිදුවනු ඇත. හදිසි අනතුරු සිදුවන අවදානමක් පෙන්වන අතර ගැටෙන වැටෙන කැපෙන කෙටෙන වැඩ කරන අය මෙන්ම විශේෂයෙන් රථ වාහන පදවන්නන් සිය ආරක්ෂාව ගැන දෙවරක් සිතට ගත යුතු සතියකි. කෙසේ නමුත් මෙම ග්‍රහ තත්ත්වය අනුව ඉදිරි සතිය ඔබගේ ලග්නයට අනුව විමසීමේදී ලග්න පහකට පැතුම් ඉටුකර ගන්නට මග පෑදෙන අතර, ලග්න හතකට තීරණාත්මක සතියක් බව පෙන්නුම් කරයි.

### මේෂ

## අමුතු හැඟීම්

උදරය ආශ්‍රිත යම් යම් අපහසුතා දැනෙනු ඇත. හදිසි ආරංචි ලැබේ. නීතිය සම්බන්ධ කතාබස් ඇති කෙරේ. වෙනදාට වඩා අමුතු හැඟීම් ඇති කෙරෙන අතර සතිය අවසාන භාගයේ දුර ගමන්, ආගමික අංශය සමග ගනුදෙනු මෙන්ම හදිසි මූල්‍ය වාසිද පෙන්නුම් කෙරේ.

### වෘෂභ

## සතුරන් පරදී

විශේෂ ගමන් බිමන් යෙදෙන අතර, දියර සම්බන්ධ කාරණා ගැන ලැබීම් පෙන්වයි. රැකියා ලැබීමේ මෙන්ම රැකියා කරන්නන්ට විශේෂ වරප්‍රසාද හිමිවේ. ස්ත්‍රී පුරුෂ ආකර්ෂණය ලැබෙන සතියකි. සතුරන් පරාජය කිරීමට හොඳම දින හතකි. ව්‍යාපාරවලින් වැඩි වාසි හිමිවේ.

### මිථුන

## ප්‍රවේශම වැදගත්

රැකියාව සම්බන්ධ හදිසි ලැබීම් යෙදෙනු ඇත. නව සබඳතා ගොඩනැගෙන අතර, සතිය අගදී සිත් තැවුල්, අවනම්බු ඇතිවිය හැකිය. ගනුදෙනු ප්‍රවේශමෙන් කළ යුතු සතියකි. රෝග තත්ත්ව ගැන අවධානයට හේතු යෙදේ. ප්‍රවේශම් විය යුතුය.

### කටක

## ස්ත්‍රී පුරුෂ විශේෂ බැඳීම්

ස්ත්‍රී පාර්ශ්වයෙන් විශේෂ වාසි යෙදෙනු ඇත. දුර ගමන් බිමන් වාසි මෙන්ම දුර බැහැර සිටි අයකු ඔබ සොයාගෙන පැමිණේ. සමාජය සමග සම්බන්ධතා තර කෙරේ. සතිය අගදී ගනුදෙනුවලින් පාඩු විය හැකිය. සති අගදී ස්ත්‍රී පුරුෂ බැඳීමකට හේතු යෙදේ.

### සිංහ

## බලාපොරොත්තු ඉටුවේ

සතිය ආරම්භයේදීම විරුද්ධ ලිංගිකයන් සම්බන්ධ විශේෂ ආරංචියකින් සතුටට හේතු යෙදෙන අතර, තමා කලක සිට බලාපොරොත්තුවෙන් සිටි දෙයක් ඉටුවන බවට ස්ථිර වීමක් සිදුවනු ඇත. එහෙත් සතිය අවසානයේ ශරීරයේ අප්‍රාණික බවක්, පීඩාකාරී බවක් දැනේ.

### කන්‍යා

## විශේෂ වාසි

සතිය ආරම්භයේ සිත් සතුටට හේතු යෙදේ. පවුලේ හෝ පිටස්තර අයකු ගැන සුබ ආරංචියක් ලැබෙනු ඇත. ගමන් බිමන්වලින් වාසි අත්වේ. හදිසි ධන ලාභ මෙන්ම වාහන ලාභ වැනි විශේෂ වාසිද යෙදේ.



19 පිටුවට

20 පිටුවෙන්

**තුලා**

## නව සබඳතාවකට ඉඩ

ආදරණීය හැඟීම් වර්ධනය කෙරෙන අතර, නව සබඳතා තර කෙරේ. රාග සිතුවිලි පහළ වන අතර, ඊට විශේෂ අවස්ථාද යෙදේ. වියදම් ඉහළ යා හැකිය. කතාව ප්‍රවේශමෙන් කළ යුතුය. සතිය අගදී ප්‍රවේශම් විය යුතුය. හිතවතුන් අමනාප විය හැකිය.

**වෘශ්චික**


## නව සැලසුම්

උත්සාහයේ තරමට ප්‍රතිඵල ලැබෙනු ඇත. ස්ත්‍රී පාර්ශ්වයේ අයෙක් අමුත්තකු ලෙස නිවසට පැමිණෙනු ඇත. එමෙන්ම ආර්ථික දියුණුවට විශේෂ වාසි අත්වන අතර, හිතවතුන්ගෙන් ආදර සංග්‍රහ මෙන්ම ආර්ථික වාසිද අත්වේ. නව සැලැස්මක් ගැන සිතුවිලි පහළ වනු ඇත.

**ධනු**

## උපක්‍රමශීලී වන්න

පවුලේ අය සමග ගනුදෙනු ප්‍රවේශමෙන් කළ යුතුය. එමෙන්ම දුර බැහැර ගමනකට ආරාධනා ලැබෙන සතියකි. සිතේ හැඟීම් පාලනය කරගත යුතු කාලයකි. සතිය අගදී තමාගේ නමට අගතියක් වන දේ ප්‍රචාරය විය හැකිය. උපක්‍රමශීලීව කටයුතු කරන්න.



**මකර**

## නොසිතූ ධන ලාභයක්

උදරය සම්බන්ධ අපහසුතා ඇතිකෙරේ. මුදල් වියදම ප්‍රවේශමෙන් කළ යුතු සතියකි. එහෙත් සතිය මැද භාගයෙන් පසු විශේෂ ආර්ථික ලාභ, රැකියාවේ නව ලැබීම් මෙන්ම නොසිතූ ධන ලාභයකටද ඉඩ තිබේ.

**කුම්භ**

## සතුටට හේතු යෙදේ

සතුටට හේතු යෙදේ. උත්සාහයේ ප්‍රතිඵල ලැබෙන කාලයකි. විශේෂ ආර්ථික වාසි ලැබෙනු ඇත. තමාට ලැබෙන්නට තිබූ මුදලක් ලැබෙනු ඇත. රසවත් ආහාරපාන ලැබෙන සතියකි. සතිය අගදී සතුටට කරුණු යෙදේ.

**මීන**

## දියුණුවට අවස්ථා

වෙනදා නොවූ උනන්දුවකින් වැඩකරයි. පැරණි හිතමිතුරන් හමුවේ. ගමන් බිමන්වලින් විශේෂ වාසි ලැබෙනු ඇත. තමාට අවශ්‍ය උපකරණ හෝ භාණ්ඩ ලැබෙන සතියකි. ලොතරැයි හෝ වෙනත් වාසි ලැබෙනු ඇත. දියුණුවට විශේෂ අවස්ථා උදාවේ.

**ජ්‍යොතිෂ පුවත්පත් රැසක හිටපු ප්‍රධාන කර්තෘ,
ජ්‍යොතිෂවේදී, ජ්‍යොතිෂ පර්යේෂක,
ජේ.එන්.කේ. රත්නායක
යටිගල්ඔළුව
0777579404**

# පෙර කල පව් පල දෙන අන්ධ ග්‍රහයෝ...

**විශ්වයේ මහා අද්භූත බලවේගයන්ගේ ක්‍රියාකාරිත්වය දිහා බලාගෙන ඉන්නකොට අපිට හිතෙනවා මේ හැමදේම සිද්ධ වෙන්නේ අහම්බෙන්ද කියලා. හැබැයි ජ්‍යොතිෂ විද්‍යාවේ ගැඹුරුම තැන් හොයලා බලද්දී අපිට හමුවෙනවා කවුරුත් බාහිරින් කතා කරන්න බය, හැබැයි මිනිස්සුන්ගේ ජීවිත අඩි සිය ගණනක් අගාධයට ඇදලා දාන්න පුළුවන් සුවිශේෂී ග්‍රහ පිහිටීමක්. ඒ තමයි 'අන්ධ ග්‍රහයෝ' එහෙමත් නැත්නම් තමන්ගේ දෘෂ්ටිය අහිමි වුණු ග්‍රහයන්ගේ බලපෑම. පත්තර පිටුවක් දිහා බලලා කේන්දරේ දිහා ඇස් යොමු කරන ඕනෑම කෙනෙක් තමන්ගේ ලග්නය ගැන, තමන්ගේ මහ දශාව ගැන හිත හිත සතුටු වෙනවා ඇති. හැබැයි තමන්ගේ කේන්දර කොනක, කාටවත් නොදැනී මේ කියන අන්ධ ග්‍රහයෙක් සැඟවිලා ඉන්නවා නම්, එතැනින් මතු වෙන්නේ පෙර ආත්මයක ඔබ කරපු, ඔබටම අමතක වුණු මහා කර්මයක දෝංකාරයයි.**

අපි කවුරුත් දන්නවා ග්‍රහයෙක් බලවත් වුණාම සුබ පල දෙනවා, දුර්වල වුණාම අසුබ පල දෙනවා කියලා. හැබැයි ග්‍රහයෙක් අන්ධ වෙනවා කියන්නේ ඊට වඩා හාත්පසින්ම වෙනස්, ඉතාමත් සංකීර්ණ තත්ත්වයක්. සාමාන්‍යයෙන් කේන්දරයක ලග්නය කියන්නේ මිනිසෙකුගේ පෞරුෂය සහ උපත නියෝජනය කරන ප්‍රධානම තැනයි. මේ ලග්නයෙන් පටන්ගෙන කොටු දොළහක් පුරා විහිදෙන විශ්ව සිතියමේ, ඇතැම් රාශිවල ග්‍රහයන් පිහිටන ක්‍රමවේදයන් අනුව ඒ ග්‍රහයන්ට තමන්ගේ ඉදිරි දැක්ම, නැත්නම් සුබ අසුබ බෙදා වෙන් කරලා දීමේ ශක්තිය අහිමි වෙනවා. හරියටම කිව්වොත්, ඇස් පෙනීම තියෙන කෙනෙක් පාරක් දිගේ ඇවිදගෙන යනකොට වළවල් මගඇරලා යන්න පුළුවන් වුණත්, දැස් අන්ධ වුණු කෙනෙක් පාරේ යද්දී ඕනෑම වෙලාවක මහා ප්‍රපාතයකට ඇදෙන්න තියෙන ඉඩකඩ වැඩියි. අන්න ඒ වගේ, කේන්දරයක අන්ධ ග්‍රහයෙක් නිර්මාණය වුණාම, ඒ ග්‍රහයා තමන්ගේ මහ දශාව ඇතුළතදී මනුස්සයාව මෙහෙයවන්නේ කිසිම ඉලක්කයක් නැතිව, අඳුරේ අතපත ගාන අසරණයෙක් වගෙයි.

මේ තත්ත්වය පිටුපස තියෙන්නේ සම්පූර්ණයෙන්ම පෙර කල පව් පල දීමේ කර්ම ශක්තියයි. බුදු දහමේ වුණත් පැහැදිලිවම කියවෙනවා කර්මය කියන්නේ වළක්වන්න බැරි සොබාදහමේ නීතියක් කියලා. ඔබ පෙර ආත්මයකදී අනුන්ගේ ඇස් වැසුවා නම්, සමාජයට වංචා කරලා සත්‍යය සඟවන්න කටයුතු කළා නම්, නැත්නම් අසරණ මිනිසුන්ගේ ජීවිත අඳුරට ඇද දැමීමට දායක වුණා නම්, මේ ආත්මයේදී ඔබ උපදින මොහොතේ විශ්වයේ ග්‍රහ තාරකාවන් පෙළගැසෙන්නේ ඔබේ කේන්දරයේ ප්‍රබල ග්‍රහයෙක් අන්ධ කරවමින්. බොහෝ දෙනෙක් අහනවා ඇයි මම හැමදාම එකම තැන පල් වෙන්නේ, ඇයි මට හැම තැනින්ම වංචාවල් සිද්ධ වෙන්නේ, ඇයි මගේ ව්‍යාපාර බිඳ වැටෙන්නේ කියලා. කේන්දරේ උඩින් බලලා රවි, සඳු, කුජ, බුධ, ගුරු, සිකුරු, සෙනසුරු හැමෝම හොඳින් ඉන්නවා වගේ පෙනුණත්, මේ අන්ධ ග්‍රහ බලපෑම ක්‍රියාත්මක වෙන කොටුව ඇතුළේ ජීවිතයේ මහා බිඳවැටීම් ලියැවිලා ඉවරයි.

විශේෂයෙන්ම රවි සහ සඳු කියන රාජකීය ග්‍රහයන් දෙන්නා, එහෙමත් නැත්නම් අපේ ජීවිතයට ආලෝකය දෙන ප්‍රධානම තරු දෙක අන්ධ තත්ත්වයට පත් වුණොත් සිද්ධ වෙන්නේ මහා විනාශයක්. රවි කියන්නේ ආත්ම ශක්තිය, පිය පාර්ශ්වය සහ රැකියාවේ උසස්වීම් හඟවන ග්‍රහයා. රවි අන්ධ වුණු කේන්දර හිමියා සමාජය ඉස්සරහා කොච්චර දඟලලත්, කොච්චර දක්ෂතා තිබ්බත් කිසිම කෙනෙක් ඔහුව අගය කරන්නේ නැහැ. ඔහු කරන හැම හොඳක්ම නරකක් විදිහටයි සමාජයට පෙනෙන්නේ. ඒ වගේම සඳු කියන්නේ මනස

## ග්‍රහ අපල දිය කර හරින කේන්දරේ නැති රහස...

සහ මව් පාර්ශ්වයයි. සඳු අන්ධ වුණු කෙනෙක් හැම වෙලාවකම ඉන්නේ මානසික පීඩනයෙන්, තනිකමෙන් සහ කිසිම හේතුවක් නැතිව ඇතිවෙන බයෙන්. ඔවුන් ගන්නා තීරණ තමන්වම විනාශ මුඛයට ඇද දමනවා. මේක හරියට තමන් විසින්ම තමන්ගේ බෙල්ලට තොණ්ඩුව දාගන්නවා වගේ වැඩක්.

ඒ විතරක් නෙවෙයි, ධනයට සහ විවාහයට අධිපති සිකුරු ග්‍රහයා කේන්දරයක අන්ධ වුණොත්, ඒ පුද්ගලයාට කවදාවත් සාර්ථක පවුල් ජීවිතයක් ගත කරන්න ලැබෙන්නේ නැහැ. පිටතින් බලනකොට ඉතාමත්

## අටවැන්නේ සැඟවුණු මාරකය...

ලස්සන, ධනවත් සහකරුවෙක් හෝ සහකාරියක් ලැබුණත්, ඇතුළාන්තයෙන් ඒ විවාහය මහා අපායක් බවට පත් වෙනවා. රහස් සම්බන්ධතා, ද්‍රෝහිවීම් සහ නොදැනුවත්වම සිද්ධ වෙන අතිවිශාල මූල්‍යමය පාඩු නිසා ඔවුන් මුළු ජීවිත කාලයම පසුතැවීමෙන් ගෙවා දමනවා.



ව්‍යාපාරයක් කරන්න ගියත්, කවුරුහරි වංචාකාරයෙක්ට අහුවෙලා තමන් සතු සේසතම අහිමි කරගන්න තැනට මේ අන්ධ ග්‍රහයා කටයුතු සූදානම් කරනවා. මේ හැමදේම සිද්ධ වෙන්නේ අර පෙර ආත්මයේ රැගෙන ආපු ණයගැතිභාවය මේ ආත්මයේදී ගෙවලා ඉවර කරන්න සිද්ධ වෙන නිසයි.

හැබැයි මේ භයානක තත්ත්වයෙන් ගැලවෙන්න ක්‍රමයක් ඇත්තෙම නැද්ද? ජ්‍යොතිෂ විද්‍යාව කියන්නේ මිනිස්සුන්ව බය කරලා වට්ටන ශාස්ත්‍රයක් නෙවෙයි, මඟ පෙන්වන ශාස්ත්‍රයක්. ඔබේ කේන්දරයේ මෙවැනි අන්ධ ග්‍රහයෙක් සිටිනවා නම්, මුලින්ම කළ යුත්තේ ඒ ග්‍රහයාට අදාළ කර්ම ශක්තිය හඳුනාගෙන අධ්‍යාත්මිකව බලවත් වීමයි. වත්පිළිවෙත්, දානමාන සහ අසරණ මිනිසුන්ට, විශේෂයෙන්ම දෘශ්‍යාබාධිත පුද්ගලයන්ට උපකාර කිරීම මගින් මේ අසුබ කර්ම දෝෂයන් බොහෝ දුරට සමනය කරගන්න පුළුවන්. විශ්වය කියන්නේ අපිට දඬුවම් දෙන තැනක් නෙවෙයි, අපේ වැරදි හදාගන්න අවස්ථාව දෙන මහා කැඩපතක්. ඒ නිසා තමන්ගේ කේන්දරයේ සැඟවුණු මේ අන්ධ ග්‍රහයන්ගේ රහස නිවැරදිව හඳුනාගෙන, බුද්ධිමත්ව සහ ඉවසීමෙන් කටයුතු කළොත්, පෙර කල පව් පල දෙන මහා අන්ධකාරයෙන් මිදිලා, ජීවිතයට අලුත් ආලෝකයක් ළඟා කරගන්න ඔබට අනිවාර්යයෙන්ම මඟ පෑදෙනවා ඇති.

**ජ්‍යොතිෂවේදී
ඔස්මන් පෙරේරා**